දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජුනි/ජූලි

Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

භූවිසා 2.1 - සම්පත් සංවර්ධනය හා සැලසුම්කරණය

GYG 2.1 - Resource Development and Planning

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. “නවීන තාක්ෂණය හා සන්නිවේදන අවස්ථා හේතු කොට ගෙන සම්පත් කෙරෙහි ඇති මානව ඇගයුම පුළුල් වේ.” නිශ්චිත නිදසුන් ඇසුරින් විමසන්න.

(ලකුණු 20)

02. “මානව සම්පත” අර්ථ දක්වා, ශ්‍රී ලංකාවේ වත්මන් මානව සම්පත් පැතිකඩ ආශ්‍රිත ව පැන නැඟී ඇති අභියෝග උචිත දත්ත සහිත ව විග්‍රහ කරන්න.

(ලකුණු 20)

03. ස්වාභාවික සම්පත් උපයෝජනය කෙරෙහි රටක ජනසංඛ්‍යා වර්ධනයේ බලපෑම කෙබඳු වේද? නිදසුන් දක්වමින් විමර්ශනය කරන්න.

(ලකුණු 20)

04. බහුවිධ පරිහරණ රටා හේතු කොට ගෙන භූමි සම්පත කෙරෙහි විවිධ බලපෑම් එල්ල වී තිබේ. එම බලපෑම් ශ්‍රී ලංකාව ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. තිරසර සංවර්ධනය නැතහොත් ධරණීය සංවර්ධනය (Sustainable Development) අර්ථ දක්වා, ගෝලීයව සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙන් වෙන්ව ගෙන තිරසර සංවර්ධන සංකල්පය එම රටවල විද්‍යමාන වන අයුරු සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. ගෝලීයව, ජනගහන වර්ධනය සමග උද්ගත වී ඇති ගැටළු අතර ජල අර්බුදය ප්‍රමුඛ ස්ථානයක් ගෙන තිබේ. ජල අර්බුදයට හේතු වී තිබෙන කරුණු 5 ක් සංවර්ධනය වෙමින් පවතින රටවල් ඇසුරෙන් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. සම්පත් සංවර්ධනය හා කළමනාකරණය කෙරෙහි ගෝලීයව මෙන්ම ශ්‍රී ලංකාවේ ද අවධානය යොමු විය යුත්තේ ඇයි? ඔබේ අදහස වෙන වෙනම ගෙන, නිදසුන් ලබා දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් කරුණුවලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. දේශගුණය පිළිබඳ කෝපන් හේගන් සමුළුව (Copenhagen Conference)
2. එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහන (United Nations Environmental programme)
3. ශ්‍රී ලංකාවේ වන සම්පත්
4. ගෝලීය ආහාර අර්බුදය

(ලකුණු 10X2 = 20)